2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

## නැදිමාල-536



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 536-නැදිමාල

# ග්‍රාම සංවර්ධන සැලැස්ම




ආර්ථික සංවර්ධන නිලධාරී

ඩබ්.ඒ.දයාරත්න මහතා

# පටුන

**පිටු අංක**


1. ඓතිහාසික පසුබිම 01
2. ව්‍යුහාත්මක පසුබිම 02
3. සිතියම. 02
4. සාමාජීය හා සංස්කෘතික කරුණු. 03
5. යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම (මාර්ග, කාණු, පාලම්, ඇල මාර්ග) 04
6. යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම (මාර්ග) 05
7. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන සැලැස්ම 06
8. සමාජ සංවර්ධන සැලැස්ම 07
9. කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම 08
10. සමාජ සංවර්ධන සැලැස්ම - ජල පීඩනය ස්ථාපනය කිරිම සඳහා ක්‍රමවේදයක් කිරිම. 09
11. සමාජ සංවර්ධන සැලැස්ම -සෞඛ්‍ය පෝෂණ නගා සිටුවිම හා වර්ධනය කරලීම. 10
12. ජීවනෝපාය සංවර්ධන සැලැස්ම. 11
13. සමාජ සංවර්ධන සැලැස්ම -ළමා අපයෝජන වැලැක්වීමේ හා ළමා සංවර්ධනය. 12
14. යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම-අවශ්‍යතාවන්ට අනුව විදි පහන් ස්ථාපනය කිරිම. 13
15. සමාජ සංවර්ධන සැලැස්ම නිපුනතා හා හැකියා වර්ධනය. 14
16. සමාජ සංවර්ධන සැලැස්ම -තාවකාලික පදිංචිකරුවන් පිලිබඳ නියාමනයක් ඇති කිරීම. 15
17. පරිසර කලමනාකරණ සැලැස්ම (ආපදා, ඩෙංගු) 16
18. මත් ද්‍රව්‍ය පාලනය හා භාවිතය නියාමනය කිරිම සඳහා ආරක්ෂිත ක්‍රමවේදයන්. 17
19. ක්‍රිඩා කටයුතු හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් වර්ධනය කිරීම. 18
20. සනීපාරක්ෂක සමාජ සංවර්ධන පහසුකම් සංවර්ධනය. 19
21. සමාජ සංවර්ධනය දහම් පාසල් සංවර්ධනය. 20
22. වැඩිහිටි ප්‍රජාව වෙත අවධානය යොමු කිරීම. 21

## 01.ඓතිහාසික පසුබිම

දෙහිවල ඓතිහාසික ඉතිහාසය පිළිබඳ විවිධ අදහස් ජනප්‍රවාදයේ සඳහන් වේ. දෙහිවල යන නාමය සෑදි ඇති ආකාරය පිළිබඳව ජනප්‍රවාදයේ විවිධ අදහස් පවතියි. මේ අයුරින් පොකුණු හා වලවල් ඇති ප්‍රදේශයත් දිය+වල පසුව දෙහිවල වූ බවට මතයක් ඇත. දෙහි වගාවට ඉතාම ප්‍රසිද්ධියක් ලැබූ බවත් දෙහි කැළෑව පසුව දෙහිවල වු බවට තවත් ජනප්‍රවාදයක් පවතියි. දෙහිවල කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 15 කින් සමන්විතය. මෙය විශාලතම ග්‍රාමනිලධාරි කොට්ඨාශයද වන අතර මෙය හෙක්ටයාර් 0.70 (ව.කි.මී. 70.0) වපසරියක මෙම වසම පිහිටා ඇත.

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතරින් දෙහිවල සහ රත්මලාන එක් පරිපාලනයක් ලෙස පවත්වාගෙන ගියද 1992.11.30 දිනූ රජයේ ගැසට් පත්‍රය මගින් දෙහිවල වෙනම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් ලෙස වෙන්කරන ලදී.

නැදි+මයිලනු යන වචනය එක් වීමෙන් නැදිමාල යන වචනය ජන වහරට පැමිණි බව ජනප්‍රවාදයේ දක්නට ඇත. ''නැදි'' යනු හේනේ නැන්දා ලෙස හඳුන්වන රජක කුල (ඩෝබි කාන්තාවයි) ''මයිලනු'' යනු" මාමා වේ. නැන්දලා මාමලා සිටි ගම නැදිමාල වු බවට ජනප්‍රවාදයේ සඳහන්ය.

කෝට්ටේ සිරි පැරකුම්බා රජු ඇතුළු ප්‍රභූන්ගේ කටයුතු ඉටුකල රෙදි නැන්දලාට රෙදි මාමාලාට කෝට්ටේ රජු විසින් නැදිමාල ගම ගම්වර කරදුන් බවට මතවාදයක් පවතියි. කෝට්ටේ සිරි පැරකුම්බා රජු රාජ සභාවේ ප්‍රභූන්ගේ දැලි රැවුල් පනිත්ත කුලයේ අයටද කෝට්ටේ රජු විසින් නැදිමාල ගමවර කරදුන් බවට ජන ප්‍රවාදයේ සඳහන්ය. නැදිමාල වසම තුල ප්‍රධාන වශයෙන් සිංහල, මුස්ලිම්, දෙමළ, මැලේ, බර්ගර් ජන කොටස් ජීවත් වෙයි. ආගම් වශයෙන් ගත් කල බෞද්ධ, ඉස්ලාම්, හින්දු, කතෝලික ජනකොටස් ප්‍රධාන වශයෙන් සහ පිවනයෙන් මෙහි ජිවත් වේ. මෙහි 75% ජනතාව ස්ථිර පදිංචි කරුවන් වන අතර 25% ජනතාව පමණ කුලි නිවැසියන් ජිවත් වන බව පෙනී යයි.


ප්‍රධාන ලෙස ආදායම් බෙදී යාමේ විෂමතාවක් දක්නට ලැබේ. මාසික වැටුප් අපයාගෙන ජිවත්වන අය මෙන්ම දෛනිකව වැඩකර උපයාගන්නා මදලින් ජිවත් වන අඩු ආදායම් ලාභි පිරිසක්ද මෙහි ජීවත් වෙයි. සමස්ථයක් වශයෙන් ගත් කල අඩු ආදායම් ලාභි පිරිස අඩු ප්‍රතිශතයක් ගනියි. වැඩි පිරිසක් මධ්‍යම ප්‍රාප්තිකයන් ලෙස ජිවත් වනු ලැබේ.

## 02.ව්‍යුහාත්මක පසුබිම

නැදිමාල වසමේ ලෝකයේ ප්‍රසිද්ධ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයක්, විශේෂ කාර්ය බලකාය, මිත් සෙවන, පරිවාස කාර්යාලය සණස සමිතිය, පෙර පාසල, මාතෘ හා ළමා සායන, පුස්ථකාලය, ලංකා බැංකුව, කායවර්ධන මධ්‍යස්ථානය, මහජන සෞඛ්‍ය නිලධාරි කාර්යාලය, නාන ළිඳ හා ක්‍රීඩා පිට්ටනියකින් සමන්විතය. පදිංචි නොවන නිතිමය ගැටළුවක් ඇති නිවාස සංකීර්ණ ගොඩනැගිලිද මෙහි ඇත

## 03.සිතියම.

නැගෙනහිරින් බොරලැස්ගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයත් උතුරින් කළුබෝවිල ග්‍රාම නිලධාරි වසමද, දකුණින් නැගෙනහිර කව්ඩාන ග්‍රාම නිලධාරි වසමද, බටහිරින් උද්‍යාන ග්‍රාම නිලධාරි වසම් වලට මායිම්ව නැදිමාල ග්‍රාම නිලධාරි වසම මායිම්ව පිහිටා ඇත. මෙම වසමට අයත් ප්‍රධාන මාර්ග අතර හිල් වීදිය (බාරොන් ජයතිලක මාවත) පැපිලියාන පාර, බෙල්ලන්තර පාර, ඇන්ඩර්සන් පාර, කඩවත පාර, මංගල පාර, රබර් වත්ත පාර, පීරිස් පාර ප්‍රධාන වේ. මීට අමතරව කුඩා පාරවල් අඩි 12 ත් 15 ත් අතර පවතිය. මෙය බොහෝ දුරට සංවර්ධනය කිරිම සඳහා පවතියි.




## 04.සාමාජිය හා සංස්කෘතික කරුණු.

විවිධ ආගම්වල විවිධ පුද්ගලයන් ජිවත් වන අතර ප්‍රධාන වශයෙන් බෞද්ධ සිද්ධස්ථාන 03 ක් පිහිටා ඇති අතර බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයක්, පැරණි කෝවිලක්, කතෝලික පල්ලියකින්ද මෙහි සමන්විත වේ.

## මූලික තොරතුරු.

| | | |
|---|---|---|
| පවුල් සංඛ්‍යාව | - | 2882 |
| මුළු ජනගහනය | - | 9880 |
| ස්ත්‍රී | - | 5040 |
| පුරුෂ | - | 4840 |
| සිංහල | - | 5738 |
| ද්‍රවිඩ | - | 371 |
| ඉස්ලාම් | - | 2927 |
| කතෝලික | - | 462 |
| වෙනත් | - | 382 |

## 05. යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම (මාර්ග, කාණු, පාලම්, ඇල මාර්ග)

**ගැටළුව.**

මාර්ග අබලන් වීම නිසා එදිනෙදා වැය වන කාලය හා ප්‍රමාදය වර්ෂා කාලයේදී ජලයෙන් යට වීමත් සුළු ගංවතුර ඇති වී නිවාස වලට හානි වීම.

උසස් ප්‍රමිතියෙන් යුත් දිර්ඝ කාලින පැවැත්මක් සහිත මාර්ග පද්ධතියක් සැකසීම එසේම වර්ෂා ජලය විධිමත්ව බැස යන ලෙස කාණු පද්ධති නවීකරණය කිරීම.

**උපයාමාර්ග.**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තාක්‍ෂණ නිලධාරි දෙහිවල/ගල්කිස්ස මහනගර සභාවේ ප්‍රධාන තාක්‍ෂණ නිලධාරි පලාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්‍ෂණ නිලධාරින් අබලන් වු මාර්ග, කාණු, පාලම්, ඇල ඉවුරු පරික්‍ෂා කර ගැලපෙන ක්‍රමවේදයක් යටතේ දිගුකාලීන පැවැත්මක් තහවුරු වන පරිදි සංවර්ධනය කිරීම.

### ක්‍රියාකාරකම්.

(1) ග්‍රාම සේවා වසම සමග ඒකාබද්ධව (bund) පටු පාලම පුළුල් කිරීම

(2) නැදිමාල ඇල (බොල් ගොඩ ඇල) මාර්ගය කළුබෝවිල වසම දක්වා සංවර්ධනය කිරීම M. 400 පලල අඩි 20 කුඹුක් පැල සිටුවිම, ජල ආශ්‍රිත බෝග වගා කිරීම.

(3) විජේසේකර බේකරිය පාර පැති කාණුවේ කොන්ක්‍රීට් ආවරණ දැමීම (m 200)

(4) කනත්ත අවසානයේ සිට විෂ්ණු කොවිල ආරම්භය දක්වා කානු පද්ධතියට දෙපස කොන්ක්‍රීට් පියන් දමා ආවරණය කිරීම.

(5) කඩවත පාරේ අංක 226/1 සිට 226/4 දක්වා මාර්ගය මැද ගලි දමා වතුර බැස යාම සඳහා බට දැමීම (m 150)

(6) රූපසිංහ පාරේ කාණු පද්ධතියට කොන්ක්‍රීට් පියන් දමා සංවර්ධනය කිරීම.

(7) නැදිමාල ග්‍රාම නිලධාරි කාර්යාලය අසල ජලය බැස යන කානුව සකස් කර ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම.

(8) කඩවත පාරේ විෂ්ණු කෝවිල හරස් පාර මං සන්ධියේ ඇති කාණුව සංවර්ධනය කිරිම (ගෝල්ඩ් ක්වෝටර්ස් ආයතනයට යටින් යන ස්ථානය පුළුල් කිරිම) (m 200)

(9) මිත් සෙවන ප්‍රධාන පාර ඉදිරිපිට කාණු සඳහා කොන්ක්‍රීට් ආවරණ යෙදිම.

- බොල්ගොඩ ඇල හරහ පාරු සේවාවක් දැමීම හා සංවර්ධනය කිරිම

**කාලය.**මාස 06

**පවුල් සංඛ්‍යාව.**250

**වගකීම.**

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

## 06. යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම (මාර්ග)

**ගැටළුව.**

මාර්ග අබලන් විම නිසා එදිනෙදා කාර්යයන් සඳහා වැයවන කාලය හා ප්‍රමාදය වර්ෂා කාලයේදී ජලයෙන් යටවීම කාණු සුළු ගංවතුර ඇතිවීම නිසා මාර්ග යටවිම.

**අරමුණ.**

උසස් ප්‍රමිතියෙන් යුත් දීර්ඝ කාලීන පැවැත්මක් සහිත මාර්ග පද්ධතියක් සැකසීම.

**උපාය මාර්ග.**

ප්‍රාලේ තාක්‍ෂණ නිලධාරි මහනගර සභාය තාක්‍ෂණික ඉංජිනේරු පලාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්‍ෂණ නිලධාරි සදුසු ක්‍රමවේදයක් යටතේ දීර්ඝ කාලීන පැවැත්මක් වන ඉදිරි මාර්ග සංවර්ධනය කිරිම.

**ක්‍රියාකාරකම්.**

- විජේසිරි බේකරිය පාරේ විශේෂ කාර්ය බලකාය පිටුපස කාණුව සහ පාර සංවර්ධනය කිරීම.
- ඇන්ඩර්සන් පාරේ අංක 122 සිට 120/9 දක්වා කාණුව දමා පාර සංවර්ධනය කිරීම.
- කඩවත පාරේ අංක 170 සිට 177/8 දක්වා මාර්ගය සංවර්ධනය කිරීම. (m 150)
- පතලවත්ත පාර කාපට් කිරීම.
- නිකපේ මාවත කාපට් කිරීම.

**කාලය.**

මාස 03

**පවුල් සංඛ්‍යාව.**

250

**වගකීම**-දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

## 07. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන සැලැස්ම

**ගැටළුව.**

රාජ්‍ය නිලධාරින් සඳහා යෝග්‍ය නිශ්චිත ස්ථානයක් නොමැතිවීම.

**අරමුණ.**

රාජ්‍ය නිලධාරින් සහ සේවා ලාභීන්ට එකම ස්ථානයක පොදු පහසුකම් සැලසීම.

**උපාය මාර්ග.**

සියලු රාජ්‍ය නිලධාරින්ට පහසුකම් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරිම සහ කාර්යක්‍ෂම සේවාවක් ලබා ගැනීම.

**ක්‍රියාකාරකම්.**

- ❖ නැදිමාල මාතෘ හ ළමා සායන ගොඩනැගිල්ල බහු කාර්ය මධ්‍යස්ථානයක් ලෙස එකම ස්ථානයක ස්ථාපිත කර සංවර්ධනය කිරීම.
- ❖ දහනායක ක්‍රීඩාපිටිය ක්‍රීඩා පහසුකම් සහිතව සංවර්ධනය කිරීම

**කාලය.**

අවුරුදු 02

**පවුල් සංඛ්‍යාව.**

2882

**වගකීම.**

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

## 08. සමාජ සංවර්ධන සැලැස්ම

**ඩෙංගු මර්ධනය සඳහා සුදුසු ක්‍රමවේදයක් ස්ථාපිත කිරිම.**

**ගැටළුව.**

ඩෙංගු උවදුර උත්සන්න වීම.

**අරමුණ.**

ඩෙංගු ව්‍යාප්තිය පාලනය හා අවම කිරිම.

**උපයාමාර්ග.**

- ❖ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව සම්බන්ධ කරගෙන වැඩ පිලිවෙලක් සැකසීම.
- ❖ පලාත් සභාව හා මධ්‍යම රජය සහ සෞඛ්‍ය අමාත්‍යංශයේ ඩෙංගු මර්ධන ඒකකයක් ස්ථාපනය කිරිම. එසේම ආපදා කලමනාකරණ වැසි ජලය නිසි අයුරින් කිරීමට නිසි ක්‍රමවේදයක් සැකසීම

**ක්‍රියාකාරකම්.**

- ❖ වීදි හා මාර්ග සම්බන්ධ කර ප්‍රජාව සමග සම්බන්ධීකරණයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විම.
- ❖ ශ්‍රමදාන පැවැත්විම
- ❖ කාණු ශුද්ධ කර එම කාණු නිසි අයුරින් බැහැර කිරීම කරන ක්‍රම වේද සැකසීම
- ❖ වසමේ අපිරිසිදු කාණු පිරිසිදු කිරිම ජලය බැස යන ඇල මාර්ග සහ බෝක්කුවල ඇති අනවසර ඉදිකිරීම් සුදුසු ක්‍රියා මාර්ග ගැනීම

**කාලය.**

මාස 03

**ප්‍රතිලාභීන්.**

250

**වගකීම.**

ප්‍රධාන සෞඛ්‍ය නිලධාරි, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, සෞඛ්‍ය අමාත්‍යංශය, ආපදා කලමනාකරණ නිලධාරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නිලධාරි, ග්‍රාම නිලධාරි.

## 09. කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම

**ගැටළුව.**

1. ගෙවතු වගාව සඳහා බිජ වර්ග නොමැතිවිම
2. ගෙවතු වගා පිලිබඳ නාගරික ප්‍රජාවගේ දැනුවත් භාවය අඩුවීම
3. ගෙවතු සඳහා ඉඩ නොමැතිවීම.

**අරමුණ.**

නාගරික ප්‍රජාව අතර ගෙවතු වගාව වැඩි දියුණු කිරිම වගාව කෙරෙහි යොමු කිරීම ප්‍රජාව සඳහා ඇති ඉඩ ප්‍රමානයේ සහ ස්ලැබ් මත ගෙවතු වගා කිරීමට උපදෙස් ලබා දීම.

**උපාය මාර්ග.**

උපරිම ඉඩකඩ ප්‍රමානයක ඵලදායිතාවයන් ලැබිය යුතු වගා ක්‍රමයක් හඳුන්වා දීම. සුදුසු සම්පත් ප්‍රජාව වෙත ලබා දීම කෘෂිකර්ම උපදේශිකාවන් හරහා සුදුසු වගා සැලැස්මක් සැකසිම.

**ක්‍රියාකාරකම්.**

- ❖ තිරස් වගාව හඳුන්වා දිම.
- ❖ ඵලදායිතාවයකින් යුත් දෙමුහුන් බීජ හඳුන්වා දීම.
- ❖ කෘෂි උපදේශන හරහා වැඩසටහන් පැවැත්විම.
- ❖ රෝග නිවාරණ ක්‍රම වැඩි ඵලදාව කාබනික පොහොර වගා නඩත්තු පිලිබඳ ශිල්පිය ක්‍රම හඳුන්වා දිම.
- ❖ බොන්සාවි වගාව.

**කාලය.**

මාස 06

**පවුල් සංඛ්‍යාව.**

30

**වගකීම.**

කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරි.
ගොවිජන සේවා මධ්‍යස්ථානය.
කෘෂිකර්ම නිලධාරි.
සංවර්ධන නිලධාරි.
සමෘද්ධි නිලධාරි.
ග්‍රාම නිලධාරි.

## 10. සමාජ සංවර්ධන සැලැස්ම

**ගැටළුව.**

ජලය අඩු පීඩනයකින් ලැබිම නිසා දෛනික කාර්යේදි නිසි අයුරින් ජල පහසුකම් කාර්යක්ෂමව සපයා දිම..

**අරමුණ.**

ස්ථාවර ජල පහසුකමක් ලබා ගැනීම.

**උපයාමාර්ග.**

ජලසම්පාදන මණ්ඩලය සමග සාකච්ඡා කර අවශ්‍ය කරන සැලසුම් කර ඒවා ඉදිරිපත් කිරිම.

**ක්‍රියාකාරකම්.**

- පැරණි ජල නල ඉවත්කර අළුතෙන් ජලනල එලිම.
- කාර්යබහුල අවශතාවලදී ජල පීඩනය ඉතා අඩුය.
- ක්‍රමවත්ව මහජනතාවට එදිනෙදා කාර්ය ක්‍රමවත්ව කර ගැනීම.
- වසමේ අපිරිසිදු කාණු පිරිසිදු කිරිම ජලය බැස යන ඇල මාර්ග සහ බෝක්කුවල ඇති අනවසර ඉදිකිරීම් සුදුසු ක්‍රියා මාර්ග ගැනීම

**කාලය.**

මාස 01

**ප්‍රතිලාභ.**

50

**වගකීම.**

ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව.

## 11. සමාජ සංවර්ධන සැලැස්ම

**ගැටළුව.**

පෙර පාසල්, ගර්භනි මව්වරුන්, පාසල ළමුන් අවුරුදු 05 ට අඩු අය සඳහා අඩු බර ළමුන්ගේ පෝෂණ ගැටළු.

සෞඛ්‍ය පෝෂණ නගා සිටුවීම හා වර්ධනය කිරීම

**අරමුණ.**

ප්‍රදේශයේ පෝෂණ ගැටළු අවම කිරීම නිරෝගිමත් සෞඛ්‍ය සම්පන්න පුරවැසියෙක් බිහිකිරිම.

**උපයාමාර්ග.**

- ප්‍රජා වෛද්‍ය නිලධාරින් සම්බන්ධීකරණය තුලින් ප්‍රයත්න වැඩසටහන් සංවිධානය

**ක්‍රියාකාරකම්.**

- අඩුබර සහිත ළමුන්ට ත්‍රිපෝෂ ලබාදිම.
- පෝෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- මාතෘ සායන සඳහා සහභාගි නොවන අය ඒ සඳහා සහභාගි කරවීම.
- නිවැරදි හා පෝෂණ වැඩසටහන් පැවැත් විය යුතු අතර එම නිවරදි රටාවක් හඳුන්වාදිම.
- පෝෂණ මල්ල ලබා දීමට සහාය ලබා දීම.

**කාලය.**

මාස 03

**ප්‍රතිලාභ.**

40

**වගකීම.**

පවුල් සෞඛ්‍ය නිලධාරි

ප්‍රධාන සෞඛ්‍ය නිලධාරි

## 12. ජීවනෝපාය සංවර්ධන සැලැස්ම.

**ගැටළුව.**

නිෂ්පාදනය සඳහා වෙළඳ පොළ ධාරිතාව අඩු විම ස්ථිර ආදායමක් නොමැති වීම නිසා සාමාජිය හා ආර්ථික ගැටළු වලින් පීඩා විඳීම.

**අරමුණ.**

- ❖ පුළුල් නිෂ්පාදන වෙළඳ පොලක් ඇති කිරිම.
- ❖ ස්වයං රැකියාවලට යොමු කිරීම.
- ❖ ස්වයං උත්පාදන මාර්ග වැඩි කිරීමට ස්වයං රැකියාවලට යොමු කිරිම.

**උපාය මාර්ග.**

- ❖ තරගකාරි නෂ්පාදන වෙළඳ පොලක් හඳුන්වා දීම.
- ❖ ආකර්ෂනිය නිෂ්පාදන ක්‍රියාවලියක් හඳුන්වා දිම (ඇසුරුම් කිරිම)
- ❖ වෙළඳ පොලට හා ලේබල් කරණය ගුණාත්මක උසස් නිෂ්පාදන හඳුන්වා දිම.
- ❖ ආදායම් මට්ටම ඉහල නැංවිම.

**ක්‍රියාකාරකම්.**

1. අවශ්‍යතාවය - කෑම විකිණීමට කරත්තයක්
2. අවශ්‍යතාවය - කැම විකිණීමට කරත්තයක්
3. අවශ්‍යතාවය සීලර් - 01 ඉලෙක්ට්‍රොනික් තරාදිය
4. අවශ්‍යතාවය - කරත්තයක්

**කාලය.-**අවුරුදු 02

**ප්‍රතිලාභින්-**04

**වගකීම.**

- ❖ විද්‍යා හා තාක්ෂණ නිලධාරි.
- ❖ මැහුම් උපදේශිකා.
- ❖ කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි.
- ❖ වනිතා සංවර්ධන නිලධාරි.
- ❖ මානව සම්පත් නිලධාරි.

## 13. සමාජ සංවර්ධන සැලැස්ම

**ගැටළුව.**

ළමා අප යෝජනය හා හිංසනය වාර්තා ගත නොවූ නමුත් දිගින් දගටම අපයෝජනයට ලක්වන දරුවන් හඳුනා ගැනීම.

ළමා අපයෝජන වැලැක්වීමේ හා ළමා සංවර්ධනය

**අරමුණ.**

ළමා අපයෝජණය හා ළමා හිංසනය වැඩලීම.

**උපාය මාර්ග.**

ළමා හා කාන්තා කටයුතු අමාත්‍යංශය සමගින් ළමා අපයෝජණය වැලැක්වීමට සැලැස්මක් සාද ක්‍රියාවට නැංවීම.

**ක්‍රියාකාරකම්.**

- ❖ නැදිමාල පරිවාස කාර්යාලය වෙත දරුවන් යොමු කිරීම.
- ❖ අවධානම් සහිත දරුවන් හඳුනාගෙන ළමා හා පරිවාස නිලධාරි මගින් දරුවන් ඉදිරි ආරක්ෂාවට යොමු කිරීම හෝ සුදුසු ක්‍රියා මාර්ග ගැනිම.
- ❖ දෙමව්පියන් සහ දරුවන් දැනුවත් කිරීම.
- ❖ පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩ සටහන් පාසල් වල ක්‍රියාත්මක කිරීම.
- ❖ කර්නල් මාවතේ ඉදිරිපස ගේට්ටුව නවීකරණය කිරීම.
- ❖ ජල ටැංකිය සහිත ජලනල පද්ධතිය සංවර්ධනය කිරීම.
- ❖ මිත් සෙවන රජයේ විශේෂිත ළමා පුනරුත්තාපන මධ්‍යස්ථානය.
- ❖ මිත් සෙවන ආයතනයට අයත් භූමිය මැනුම් කටයුතු සිදු කිරීම.
- ❖ දරුවන් සඳහා කෑම ශාලාව සහ මුළුතැන්ගෙය ප්‍රමාණවත් නොවේ. (නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම)
- ❖ ගලි පද්ධති නවීකරණය කිරීම.
- ❖ කාර්යාලය සඳහා පොටෝ කොපි මැෂිමක් හා මුද්‍රණ උපකරණ ලබා ගැනීම.
- ❖ මිත් සෙවන වටා ඇති තාප්පයේ තීන්ත ආලේප කිරීම.

**කාලය.**

මාස 02

**ප්‍රතිලාභින්.** 08

**වගකීම.**

- ළමා හා පරිවාස නිලධාරි.
- ළමා හිමිකම් නිලධාරි.
- ළමා හා කාන්තා කාර්යංශය.
- පරිවාස දෙපාර්තමේන්තුව.
- ප්‍රධාන මහජන සෞඛ්‍ය නිලධාරි.

## 14. යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම

**ගැටළුව.**

විදුලිය නොමැති වීම.

අවශ්‍යතාවන්ට අනුව විදී පහන් ස්ථාපනය කිරීම.

**අරමුණ.**

විදුලිය නොමැති මාර්ග වලට විදුලිය ලබාදිම.

**උපාය මාර්ග.**

විදුලිය නොමැති මාර්ග හදුනාගැනීම හා ඇස්තමේන්තු සකස්කිරිම

**ක්‍රියාමාර්ග.**

- විදුලි බල මණ්ඩලය හරහා විදුලිය ලබා දීම සඳහා කටයුතු කිරිම.
- ඇල ඉවුර පාරෙහි විදුලි කණු සවිකර නොමැති තැන්වල විදුලි කණු සවිකර විදුලි බුබුළු සවිකිරිම (m. 200)

**කාලය.**

මාස 02

**ප්‍රතිලාභීන්.**

20

**වගකීම.**

විදුලි බල මණ්ඩලය

## 15. නිපුණතා සංවර්ධන සැලැස්ම හා හැකියා වර්ධනය.

**ගැටළුව.**

පාසල් අධ්‍යාපනය හැරගිය තරුණ තරුණියන් තුල වෘත්තිය කුසලතා අවම විම හේතුවෙන් විරැකියාවෙන් පෙලීම.

**අරමුණ.**

තරුණ තරුණියන්ගේ වෘත්තිය නිපුනතාවය ඉහල දැමීම පාසල් අධ්‍යාපනය අවසන් කල දරුවන්ගේ වෘත්තිය පුහුණුව වර්ධනය කිරිම.

- ❖ තරුණ තරුණියන්ගේ නිපුනතා සංවර්ධනය ඉහල නැංවිම මගින් නව රැකියා අවස්ථා උත්පාදනය වීම. පාරම්පරික වෘත්තින් වල නියලැන්ගේ දැනුම වර්ධනය කිරිම.

**උපාය මාර්ග.**

- ❖ න්‍යාය හා ප්‍රායෝගික පුහුණුව අවම විම එසේම පාසල අධ්‍යාපනය අතර මග නතර වුනු පිරිස්
- ❖ විධිමත්ව වෘත්තිය කුසලතාවයට යොමු කිරිම.
- ❖ වෘත්තිය පුහුණු ඇති අය වෘත්තිය පුහුණුවට යොමු කිරිම.
- ❖ නව වෘත්තිය දැනුම වර්තමානයට ගැලපෙන පරිදි යොදා ගැනීම.

**ක්‍රියාකාරකම්.**

- ❖ උසස් අධ්‍යාපනය ලබාගත් පිරිස වෛද්‍ය පාරේ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත යොමු කිරීම.
- ❖ ප්‍රතිබිම්බාරාම වෘත්තිය පුහුණු අංයතනය වෙත යොමු කිරීම.
- ❖ පල්ලිදොර වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය වෙත යොමු කිරීම.
- ❖ සිරිසේන දහනායක ක්‍රීඩාංගනයේ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් ඇරඹීම.

**කාලය.**

මාස 06

**ප්‍රතිලාභ.**

**වගකීම.**

නිපුනතා සංවර්ධන නිලධාරි.

විද්‍යා හා තාක්ෂණ නිලධාරි.

මානව සම්පත් සංවර්ධන නිලධාරි.

## 16. සමාජ සංවර්ධන සැලැස්ම

**ගැටළුව.**

අවධිමත් ඉදිකිරීම් නිසා පාරිසරික ගැටළු ඇතිවේ.
තාවකාලික පදිංචිකරුවන් පිළිබඳ නියාමනයන් ඇතිකිරීම

**අරමුණ.**

අවධිමත් ඉදිකිරීම් සිදු කිරීම අවම කිරීම..

**උපයාමාර්ග.**

වසම තුල අවධිමත් ඉදිකිරීම් ක්‍රමවත්ව සැලසුම් සහගතව ඉදිකිරීමට වැඩසටහනක් සකස් කිරීම.

**ක්‍රියාකාරකම්.**

කඩවත පාරේ සිට ප්‍රධාන ඇලට ඇති බෝක්කු පද්ධතිවල ඉදිකිරීම් ඉවත් කිරීම හෝ සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.

නාගරික සංවර්ධන අධිකාරි, නගර සභාව, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සම්බන්ධ කරගෙන පරීක්‍ෂා කර හඳුනා ගැනීම.

**කාලය.**

මාස 03

**ප්‍රතිලාභ.**

30

**වගකීම.**

නිවාස නිලධාරි, පරිසර නිලධාරි, කෘෂිකර්ම නිලධාරි, කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරි, නගර සභා තාක්‍ෂණ නිලධාරි, ප්‍රාදේශිය ලේකම් තාක්‍ෂණ නිලධාරි, සංවර්ධන නිලධාරි.

## 17. පරිසර කලමනාකරණ සැලැස්ම (ආපදා,ඩෙංගු)

**ගැටළුව.**

අවධිමත් කුණු කසල බැහැර කිරීම අවධිමත් ඉදිකිරීම් නිසා පාරිසරික ගැටළු ඇතිවේ. නාගරික පරිසරයක ඔවුන්ට කසල බැහැර කිරීමට ස්ථානයක් නොමැතිවීම නියමිත පරිදි එය ප්‍රවාහනය නොකිරීම.

**අරමුණ.**

අපද්‍රව්‍ය හා කැලි කසල කලමනාකරණය විධිමත් පරිදි කසල ක්‍රමවේදයක් සකස් කිරීම.

**උපාය මාර්ග.**

පරිසර හිතකාමී කසල බැහැර කරන ක්‍රම වේදයක් හඳුන්වාදීම. දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ අදාල නිලධාරින්ගේ සහ පරිසර අංශ සමග සාකච්ඡා කොට අදාල ප්‍රදේශයේ ජනතාව සමග වැඩපිලිවෙලක් සැකසීම.

**ක්‍රියාකාරකම්.**

කැලිකසල නිසි ලෙස ප්‍රමිතිගත කර බඳුන් ගත කිරීම. නැවත භාවිතා කරන කැලිකසල භාරගන්නා ආයතන පුද්ගලයින් හඳුන්වා දීම.

- ❖ කැලිකසල ප්‍රතිචක්‍රීය කිරීමට බඳුන් ලබා දීම. කැලිකසල කලමනාකරණය පිලිබඳ පරිසර නිලධාරින් මගින් දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම.

- ❖ ඇල ඉවුරේ නාය යාමට ලක්ව ඇති ප්‍රදේශ හඳුනා ගෙන එහි ක්‍රමවත් වැඩපිලිවෙලක් සැකසීම.
  (ඇල ඉවුර සංවර්ධනය කිරීම පීරිස් පාර කෙලවර)
  ග්‍රාමීය පරිසර කමිටු ස්ථාපිත කිරීම හා ක්ෂේත්‍ර නිලධාරින් මගින් එය දැනුවත් කිරීම.

**කාලය.**

මාස 06

**ප්‍රතිලාභ.**

50

**වගකීම.**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, දෙහිවල ගල්කිස්ස මහනගර සභාව, පහත් බිම් සංවර්ධන මණ්ඩලය ආපදා.

## 18. මත් ද්‍රව්‍ය පාලනය හා භාවිතය නියාමනය කිරීම සඳහා ආරක්ෂිත ක්‍රමවේදයන්.

**ගැටළුව.**

පාසල් වයසේ පසුවන දරුවන් සහ තරුණ තරුණියන් මත් ද්‍රව්‍යවලට යොමුවීම.

**අරමුණ.**

පාසල් වයසේ ළමුන් මත් ද්‍රව්‍ය උවදුරින් ගලවා ගැනීම.

**උපාය මාර්ග.**

ඉලක්කගත කණ්ඩායම් යොමු කිරීම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වෙත ඔවුන් යෙදවීම.

**ක්‍රියාකාරකම්.**

සම්මන්ත්‍රණ පුහුණු වැඩසටහන් ආදියට යොමු කිරීම අත් පත්‍රිකා බෙදමින් ඔවුන්ව දැනුවත් කිරීම සහ ඔවුන්ට උපදේශන සේවාවන් ලබා දීම අන්තරායක ඖෂධ පාලක මණ්ඩලය වෙත ඔවුන් යොමු කිරීම පාසල් ළමුන් දැනුවත් කිරීම දෙමාපියන් දැනුවත් කිරීම ළමා සමාජ, යෞවන සමාජ, ක්‍රීඩා සමාජ ආදි සමිතිවල පිරිස දැනුවත් කිරීම.

**කාලය.**

මාස 06

**ප්‍රතිලාභ.**

50

**වගකීම.**

අන්තරායක ඖෂධ පාලක මණ්ඩලයේ නිලධාරි.

ළමා හා කාන්තා කටයුතු නිලධාරි.

## 19. ක්‍රීඩා කටයුතු හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් වර්ධනය කිරීම.

**ගැටළුව.**

බෝ නොවන රෝග ව්‍යාප්තියේ ක්‍රමික වර්ධනය.

**අරමුණ.**

ක්‍රීඩා කෞෂල්‍ය වැඩි දියුණු කිරිම තුලින් කායික හා මානසික සමබරතාවයකින් යුත් පුරවැසියන් බිහිකිරීම මෙහි ප්‍රධාන අරමුන බවට එක්කරලමින් බෝ නොවන රෝග වර්ධනය අඩාල කරලීම.

**උපාය මාර්ග.**

ක්‍රීඩා අමාත්‍යංශය මැදිහත් වීමෙන් තරුණ තරුණියන් සහ පාසල් දරුවන් ඒ සඳහා යොමු කිරීමට විශේෂ අවධානයක් සහ වැඩපිලිවෙලක් සැකසීම.

**ක්‍රියාකාරකම්.**

- ❖ නැදිමාල දහනායක ක්‍රීඩාංගනයේ ඇති කාය වර්ධන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම.
- ❖ ක්‍රීඩා නිලධාරි මගින් ශාරීරික සුවතා වැඩසටහන් වසම් මට්ටමින් සංවිධානය කිරීම.
- ❖ ස්ත්‍රින්ට ක්‍රීඩාංගනයේ ක්‍රීඩා කිරීමට හැකිවන ආකාරයට විදුලි බුබුළු සවිකර සංවර්ධනය කිරීම.
- ❖ ක්‍රීඩා සමිති යාවත්කාලීන කිරීම.
- ❖ ළමා උද්‍යාන ඉදිකිරීම මගින් ක්‍රීඩා කෞශල්‍ය ඉහල දැමීම

**කාලය.**

මාස 06

**ප්‍රතිලාභ.**

50

**වගකීම.**

දෙහිවල ගල්කිස්ස මහනගර සභාව, ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ක්‍රීඩා නිලධාරි, තරුණ සේවා සභාව.

## 20. සනීපාරක්ෂක සමාජ සංවර්ධන පහසුකම් සංවර්ධනය.

**ගැටළුව.**

සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම.

**අරමුණ.**

විධිමත් සනිපාරක්ෂක පහසුකම් ඇති කිරීම.

**උපාය මාර්ග.**

සනිපාරක්ෂක පහසුකම් ඌනතාවයන් මග හරවාලීම මහජන සෞඛ්‍ය නිලධාරින්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින්, ප්‍රජා වෛද්‍ය නිලධාරින් හරහා සුදුසු ක්‍රියාකාරකම් දියත් කිරීම.

### ක්‍රියාමාර්ග.

- ❖ වැසිකිලි නොමැති පුද්ගලයන් සඳහා වැසිකිලි පහසුකම් සැලසීම මූල්‍යාධාර ලබා දීම අමුද්‍රව්‍ය ලබා දීම).
- ❖ අබලන් තත්වයේ ඇති වැසිකිලි ප්‍රතිසංස්කරණය කිරිම.
- ❖ ආබාධිත අය සඳහා වැසිකිලි ලබාදීම.

  සනිපාරක්ෂක පහසුකම්

**කාලය.**

මාස 03

**ප්‍රතිලාභ.**

05

**වගකීම.**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සංවර්ධන නිලධාරි, සමෘද්ධි නිලධාරි, සමාජ සේවා නිලධාරි.

## 21. සමාජ සංවර්ධනය දහම් පාසල් සංවර්ධනය.

**ගැටළුව.**

පවතින දහම් පාසල්වල ගැටළු රැසක් පැවතීම. දහම් පාසල් වෙත ළමයින් අඩු වීම.

**අරමුණ.**

දහම් පාසල්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**උපයාමාර්ග.**

ශාසනාරක්ෂක බල මණ්ඩලය, විහාරස්ථ දායක සභාව, බුද්ධ ශාසන අමාත්‍යංශය එකතුව විහාරස්ථානයේ සංවර්ධන සැලැස්මක් සෑදීම.

**ක්‍රියාමාර්ග.**

- ❖ ශාසනාරක්ෂන බල මණ්ඩලයේ ජාතික මට්ටමේ දහම් පාසලක් බවට පත් කිරීම භෞතික හා මානව සම්පත් වැඩි දියුණු කිරීම.

(1) නැදිමාල ශ්‍රී මහා විහාරස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ලේ ජනේල 20 ක් කරදීම.

(2) කොට්ඨාශයේ දහම් පාසල් සඳහා උපකරණ ලබා දීම.

(1) මේස - 20 පුටු - 20 වයිට් බෝඩ් - 05 ගරු පුටු - 05

**කාලය.**

මාස 03

**ප්‍රතිලාභ.**

313

**වගකීම.**

බුද්ධශාසන අමාත්‍යංශය, ශාසනාරක්ෂන බල මණ්ඩලය, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යංශය, ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලය.

## 22. වැඩිහිටි ප්‍රජාව වෙත අවධානය යොමු කිරීම.

**ගැටළුව.**

වැඩිහිටියන් සමාජයෙන් හුදකලා වීමෙන් පීඩාවට පත්වීම.

**අරමුණ.**

වැඩිහිටි ප්‍රජාව සක්‍රිය ලෙස සමාජ සංවර්ධනයේ පුරුක් බවට පත්කිරීම.

**උපාය මාර්ග.**

ජ්‍යේෂ්ඨ වැඩිහිටි (ප්‍රජාව) සවිබල කර සමාජ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ කිරීමට සැලැස්වීම.

**ක්‍රියාකාරකම්.**

- ❖ වැඩිහිටි සමිති මගින් විනෝද චාරිකා වන්දනා ආදිය සංවිධානය කර සහභාගි කරවීම.
- ❖ වැඩිහිටි පිරිස් ස්වේච්ඡා සංවිධාන වලට සහ ආගමික වැඩවලට සම්බන්ධ කර ගැනීම.
- ❖ සුහද හමුවලට සහභාගි කරවා ගැනීම.
- ❖ වසම් තුල වැඩි හිටි ආධාර ලබා දිය යුතු අයගේ කටයුතු ඉතා ඉක්මනින් සිදු කිරීම.
- ❖ වැඩිහිටි පනත සක්‍රිය කිරීම

**කාලය.**

මාස 03

**ප්‍රතිලාභ.**

200

**වගකීම.**

සමාජ සේවා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සමාජ සේවා දෙපාර්තමේන්තුව වැඩිහිටි.